# බිබිල ප්‍රදේශයේ පුරාවිද්‍යා උරුමය හා ඒ ආශ්‍රිත සංචරණය

දිවුලපැලැස්සේ රතන වංශ හිමි[1]

බිබිල ප්‍රදේශය ඓතිහාසික වශයෙන් ඉතා වැදගත් අර්ධ ශුෂ්ක දේශගුණික කලාපයකි. ඌව පළාතේ මොනරාගල දිස්ත්‍රික්කයට අයත් නගරයක් වන මෙම ප්‍රදේශය ස්වාභාවික සම්පත්වලින් හා පෞරාණික නටබුන්වලින් පරිපූර්ණය. කිරිවෙහෙර, මහියංගණ රජ මහා විහාරය, මුතියංගණය, දීඝවාපිය හා මහඔය උණු වතුර ළිං ආදී ස්ථාන වටකරගත් මධ්‍ය කේන්ද්‍රීය ප්‍රදේශයක් ලෙස පෙන්වාදිය හැකිය. දෛනිකව දේශීය සංචාරකයන් හා බැතිමතුන් මෙම නගරය හරහා සංචරණය කළ ද මෙම ප්‍රදේශයේ ඉතා පැරණි උරුමයන් හා ස්වාභාවික ස්ථාන කෙරෙහි අවධානය යොමු නොවීම සන්තාපයට කරුණකි. එයට ප්‍රධාන හේතුව කුමක් ද? යන්න විමසා බැලීම පර්යේෂණ ගැටලුවයි. බිබිල ප්‍රදේශය තුළ ඇති උරුමයන්හි වටිනාකම පිළිබඳ අනවබෝධයෙන් අවනතියට ලක්වන ස්ථාන ආරක්ෂා කරගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ අධ්‍යයනය කිරීම හා ප්‍රාදේශීය සංචාරක කලාපයක් කර සංචාරකයින්ගේ ආකර්ශනය ප්‍රවර්ධනය කිරීම සඳහා යෝජනාවලියක් සකස් කිරීම පර්යේෂණයේ අරමුණු වේ. ග්‍රන්ථ සංධාර, ක්ෂේත්‍ර ගවේෂණ ක්‍රමවේද හා සම්මුඛ සාකච්ඡා යන විධික්‍රම භාවිතයට ගන්නා ලදි. බිබිල ප්‍රදේශයේ ඇති පෞරාණික ස්ථාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී තිබුණ ද වසර ගණනාවකට ඉහත දී සංරක්ෂණ ක්‍රියාවලි ස්ථාන කිහිපයක සිදුකර ඇතත් අද වනවිට එම ස්ථානයන්හි පරිහාණීය ලක්ෂණ දැකිය හැකිය. මානව මැදිහත් වීමෙන් සිදුවන නව ඉදිකිරීම්, ගල් ගැලවීම, බළධාරින්ගේ මැදිහත් වීමෙන් තොරව සිදු කරන අවිධිමත් සංරක්ෂණ කටයුතු (හුණු පිරියම් කිරීම, වහලය පිළිසකර කිරීම, නව කොටස් එකතු කිරීම, ඇතැම් කොටස් ගලවා ඉවත් කිරීම) පුරාවිද්‍යා රක්ෂිතයන්හි අනවසර මානව ක්‍රියා හා නිසි නඩත්තුවක් නොමැතිවීම එම ස්ථාන විනාශ මුඛයට පත්වීමට හේතු බව කේෂත්‍ර ගවේෂණයේ දී තහවුරු විය. ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග හඳුනාගන්නා ලදි. බිබිල ප්‍රදේශයේ තෝරාගත් ස්ථාන කිහිපයක් නියැදියක් ලෙස ගෙන ප්‍රාදේශීය උරුමයන් ආරක්ෂා කරගැනීම සඳහාත් සංචාරක ප්‍රවර්ධනය ඇති කිරීම සඳහාත් ගතයුතු ක්‍රියා මාර්ග ලෙස අවධිමත් සංරක්ෂණ ක්‍රියාවලි හා අනවසර මානව ක්‍රියාකාරකම් නැවත්වීම, ප්‍රජා මූලික සංචාරක ව්‍යාපාරයක් ආරම්භ කිරීම හා ගමනාගමන පහසුකම් සංවර්ධනය කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් මෙම ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක හා ස්වාභාවික උරුමයන්ට සිදුවන අවනතිය මඟහරවා ප්‍රාදේශීය සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමත් ඒ තුළින් දළ දේශීය ආර්ථිකය ඉහල නැන්වීම සඳහා දායකත්වය සපයාගත හැකි බව වැඩි දුරටත් තහවුරු වේ.

**ප්‍රමුඛ පද :** ඌව පළාත, බිබිල, පුරාවිද්‍යා උරුමය, සංචාරය, උරුම කළමනාකරණය

---

[1] සමාජීය විද්‍යා හා තුලනාත්මක අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය.vendrathanawansha@gmail.com